www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යසර් අරෆත්: 1929-2004

## Yasser Arafat: 1929-2004

**ක්‍රිස් මාස්ඩන් සහ බැරී ග්‍රේ විසිනි**
**2004 නොවැම්බර් 12**

යසර් අරෆත් අති මහත් පෞද්ගලික ධෛර්‍යයකින් ද පලස්තීන ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් නොනැමෙන කැපවීමකින් ද යුක්ත මිනිසකු ලෙස ස්මරනය කෙරෙනු ඇත. අරෆත් ත්‍රස්තවාදියකු ලෙස හැඳින්වීමට තරම් සාහසික වී ඇති, යුද අපරාධකරුවන් වන ඒරියල් ෂැරොන් හා ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් වැන්නන්, දශක හතරකට ආසන්න කාලයක් තිස්සේ පලස්තීනුවන්ගේ ප්‍රතිරෝධයේ ජාත්‍යන්තර සංකේතය වූ අරෆත්ට එරෙහිව නගන අවලාද රොත්ත ලොව පුරා දශ ලක්ෂ සංඛ්‍යාත ජනයා පිලිකුලෙන් යුතුව ප්‍රතික්ෂේප කරනු ඇත.

මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන්, අරෆත් ම 1974 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉදිරියේ කල සිය කතාවේ දී කදිම පිලිතුරක් දුන්නේ ය:

“විප්ලවවාදියා සහ ත්‍රස්තවාදියා අතර වෙනස පවතින්නේ ඔහු සටන් වදින්නේ කුමක් අරබයා ද යන්න තුල ය. යුක්ති සහගත කාරනාවක් වෙනුවෙන් පෙනී සිටින සහ ආක්‍රමනිකයන්ට, බලාත්කාර පදිංචිකරුවන්ට හා විජිතවාදීන්ට එරෙහිව සිය භූමියේ නිදහස හා විමුක්තිය උදෙසා සටන් වදින කවරෙකු වුව ද සාධාරනව ගත් කල ත්‍රස්තවාදියකු ලෙස හැඳින්විය නො හැක. . . . යුක්ති සහගත කාරනාවන්ට එරෙහිව සටන් වදින, වෙනත් ජනතාවන්ගේ භූමි වාඩිලා ගැනීමට, විජිතයන් බවට පත් කර ගැනීමට සහ ඔවුන් පීඩනයට ලක් කිරීමට යුද්ධ කරන අය සිටී නම්, ඔවුහු ත්‍රස්තවාදියෝ ය. ඔවුන්ගේ ක්‍රියාවන් හෙලා දැකිය යුතු ය, ඔවුන් යුද අපරාධකරුවන් ලෙස හැඳින්විය යුතු ය, ඒ මක් නිසා ද කිය තොත් කාරනාවේ යුක්ති යුක්ත භාවය අරගල කිරීමේ අයිතිය තීන්දු කරන නිසා ය .”

පලස්තීනුවන් අතර පවත්නා ශෝක වීමේ පරිමාව පෙන්නුම් කරන්නේ අරෆත් කෙරෙහි පැවැති ගැඹුරු ලෙන්ගතු භාවය යි. කෙසේ වෙතත්, අන් සියල්ලට ම වඩා අවශ්‍ය වන්නේ, පලස්තීනුවන්ගේ පමනක් නොව, සමස්තයක් ලෙස අරාබි මහජනතාවගේ ම ඛේදයක් වන ඔහුගේ ඛේදනීය අවසානයෙන් දේශපාලන පාඩම් උකහා ගැනීම යි.

මෘග සූරාකෑමකට ලක් වන මැද පෙරදිග වැඩ කරන ජනයා අතර අරගල කිරීම පිනිස ධෛර්මත් භාවයේ, කැප කිරීම්වල හෝ අධිෂ්ඨානයේ මොන යම් හෝ අඩුවක් කිසිදාක නො වී ය. අඩු පාඩුව ලෙස පැවතුනේ ද අරෆත් සැපයීමට අසමත් වූයේ ද අධිරාජ්‍යවාදී ආධිපත්‍යයත් එහි නොවැලැක්විය හැකි ප්‍රතිවිපාකත්, එනම් දරිද්‍රතාව හා මර්දනයත්, අවසන් කර දැමීමේ ශක්‍ය විප්ලවවාදී ඉදිරිදර්ශනයකි.

අරෆත්ගේ ජාතික ව්‍යාපෘතිය අවසානයේ අසාර්ථක වීම තනි පුද්ගලයකුගේ ආත්මීය ගති ලක්ෂනයන්ට ආරෝපනය කල නො හැකි ය. මොනවා වුවත්, අරෆත්ගේ ශක්තීන් සහ දුර්වලකම් පිලිබිඹු කලේ ඔහු නායකත්වය දුන් දේශපාලන ව්‍යාපාරයේ ගැටලු සහ ප්‍රතිවිරෝධතා ය.

අද පලස්තීන ජනයා මුහුන දෙන හිර වීම ව්‍යතිරේකයක් නොව අනිවාර්‍යයකි. මැද පෙරදිග පුරාත් ජාත්‍යන්තර පරිමානවත් විදේශ ආධිපත්‍යයට හා සමාජ අසාධාරනයට ජාතික විසඳුමක් සෙවීමට දැරූ ප්‍රයත්නය අශක්‍ය බව ඔප්පු වී තිබේ. ඇල්ජීරියාවේ දී මෙන්, විජිත පාලනයට එරෙහි ජාතික විප්ලවවාදී ව්‍යාපාර ඍජු විදේශ ආධිපත්‍යය අවසන් කිරීමෙහි ලා සාර්ථක වී ඇති තන්හි දී පවා, අන්තර් ජාතික බැංකුවල හා සංගතවල ආධිපත්‍යය අඛන්ඩව පැවතී තිබේ, කම්කරු පන්තිය හා ගොවි ජනතාව මුහුන දෙන සමාජ කොන්දේසි මංමුලා සහගත තත්වයේ ම පවතින අතර දූෂිත දේශීය ධනේශ්වර කල්ලි පැරනි විජිත පාලකයන් විස්ථාපනය කර තිබේ.

අරෆත්ගේ ඛේදවාචකයේ මූලය වන්නේ ඔහුගේ දේශපාලන අරගලය පාදක වූ සාවද්‍ය දේශපාලන ඉදිරිදර්ශනය යි. අද -- සාපේක්ෂව අතලොස්සක් වන අන්තර් ජාතික බැංකුවල හා සංගතවල ආධිපත්‍යයට නතු වූ ගෝලීය ආර්ථිකයක් තුල -- වඩාත් ප්‍රබල ලෙස, විසි වන සියවසේ අති මූලික පාඩමේ වලංගු භාවය එලෙස ම පවතී: එනම්, ජාතික පීඩනයට හා සමාජ සූරාකෑමට විසඳුම පවතින්නේ ජාතික මාවතක් ඔස්සේ නොව, ඒ වෙනුවට ජාත්‍යන්තරවාදී හා සමාජවාදී මාවතක් ඔස්සේ ය යන වගයි.

පලස්තීන ජනතාවගේ ගැටලුව ජාත්‍යන්තර ගැටලුවකි. අධිරාජ්‍යවාදය සිය පාලනය පවත්වාගෙන යාම සඳහා යොදා ගන්නා මැද පෙරදිග පවතින ධනපති ජාතික රාජ්‍ය රාමුව තුල එය විසඳාලිය නොහැක. මැද පෙරදිග වත්මන් සමීකරනයට පලස්තීන රාජ්‍යයක් එකතු කිරීම, එය සාර්ථකත්වයට පත් වුනත් පවා, පලස්තීන ජනතාවගේ මූලික ගැටලු විසඳාලනු නැත. රාමුව ම අහෝසි කල යුතු ය, වැඩ කරන

ජනතාවගේ උවමනාවන්ට අනුරූප වන නව පද්ධතියක් මගින් එය විස්ථාපනය කල යුතු ය. එම රාමුව නම් මැද පෙරදිග එක්සත් සමාජවාදී සමූහාන්ඩුවකි. එය සාක්ෂාත් කර ගැනීමෙහි ලා සමත් සමාජ බලවේගය නම්, අධිරාජ්‍යවාදයටත් කලාපයේ ජාතික ධනේශ්වර පන්තීන්ටත් එරෙහි අරගලය තුල ග්‍රාමීය දුගීන් තම නායකත්වය යටතේ රැලි කර ගන්නා, කම්කරු පන්තිය යි.

ඉතිහාසයේ දූවැන්ත උත්ප්‍රාසයක් නම්, පලස්තීන ජාතික වැඩපිලිවෙලෙහි අසාර්ථකත්වය, විසි වන සියවසේ තවත් ප්‍රමුඛ ජාතික ව්‍යාපාරයක, එනම් සියොන්වාදයේ, ව්‍යසනය පිලිබිඹු කිරීම යි. සියොන්වාදී ව්‍යාපාරයේ "සාර්ථකත්වය" අත්පත් කර ගත්තේ මනුෂ්‍ය ඉතිහාසයේ දූවැන්ත ම ඛේදවාචකයන්ට මුහුන දුන් පීඩිත ජනතාවක් තවත් ජනතාවකගේ, එනම් පලස්තීනුවන්ගේ, පීඩකයන් බවට පරිවර්තනය කිරීම මගිනි.

පලස්තීන විමුක්ති සංවිධානයේත් අරෆත්ගේත් ඉතිහාසය නැවත නැවතත් පෙන්නුම් කරන්නේ පලස්තීන ජනතාව යටත් කර තබා ගැනීම පවත්වාගෙන ගියේ හුදෙක් ඊස්රායල ප්‍රචන්ඩත්වය හා මිලිටරි බලය මගින් පමනක් නොව අරාබි ධනේශ්වරයේ ද්‍රෝහිත්වය ද මගින් බවයි. සිය ජාතිකවාදී ක්‍රියාමාර්ගයේ පදනම මත අරාබි තන්ත්‍රයන්ට පීඩනය දැමීමටත් ඒවා අතර උපාමාරු දැමීමටත් උත්සාහ කල අරෆත්, ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ අධිරාජ්‍යවාදී හාම්පුතුන්ගෙන් හෝ කිසිදු අව්‍යාජ ස්වාධීනත්වයක් තහවුරු කර ගැනීමට කිසිදාක සමත් නො වී ය. එමෙන් ම, ඊස්රායලයට හා එක්සත් ජනපදයට ප්‍රතිභාරයක් ලෙස සෝවියට් සංගමය මත වාරු වීමට ඔහු දැරූ ප්‍රයත්නයන් නොවැලැක්විය හැකි ලෙස ඔහුව යොමු කලේ, පලස්තීන හා අරාබි ජනතාවන්ගේ අතිශයින් ම අධිෂ්ඨානවත් විරුද්ධවාදියා වන ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අනුග්‍රහය සෙවීම කරා ය.

## මහා ව්‍යසනය

ඊට දෙවසරකට පෙර ගාසාහි සිට කයිරෝවට සංක්‍රමනය වී තිබූ පලස්තීන යුවලකට දාව 1929 දී කයිරෝහි දී මොහමඩ් අබ්දෙල් රහමන් අබ්දෙල් රවුෆ් අරෆත් අල් කුඩා අල් හුසේනි යන නමින් අරෆත් උපත ලැබී ය. ඔහුගේ පියා සුලු ව්‍යාපාරිකයෙක් විය. අරෆත් පස් වන වියෙහි පසු වෙද්දී ඔහුගේ මව මිය යාමෙන් අනතුරුව ඔහු හදා වඩා ගනු පිනිස ජෙරුසෙලමේ පැරනි නගරයේ විසූ ඥාතීන් වෙත එවන ලදි. ගැටවරයකු ලෙස, අරෆත් පලස්තීනය සඳහා වූ අරගලයෙහි සමීපව නිමග්න වූවකු බවට පත් වූ අතර එයට කැප වීමෙහි ලා ඔහු කිසි දාක වැනුනේ නැත.

එම කාලයේ දී ධනවාදයට එරෙහි පොදු අරගලයක් තුල යුදෙව් සහ අරාබි කම්කරුවන් ඒකාබද්ධ කිරීම සඳහා බලගතු පන්ති හැඟීමක් පැවතුනි. එය 1921 දී පලස්තීන කොමියුනිස්ට් පක්ෂය (පීසීපී) පිහිටුවීම සඳහා තුඩු දුනි. එහෙත් පසුව මොස්කෝවේ බලය තහවුරු කර ගත් ස්ටැලින්වාදී නිලධරය පීසීපීය යොදා ගත්තේ, කම්කරු පන්තියේ පාර්ශ්වයෙන් පැන නගින මොන යම් හෝ ස්වාධීන දේශපාලනික මූලිකත්වයක් මැඩීම සමග ඒකාබද්ධව, බටහිර අධිරාජ්‍යවාදී බලයන්ට ප්‍රතිභාරයක් ලෙස මැද පෙරදිග විවිධ ජාතික ධනේශ්වර තන්ත්‍රයන් සමග සන්ධානයන් සහතික කර ගැනීම මත යොමුවූ, තමන්ගේ ම විදේශ පිලිවෙත් උවමනාකම්වලට සේවය කරනු පිනිස ය.

දශ ලක්ෂ සංඛ්‍යාත ජනකායක් සරනගතයන් බවට පත් කල, යුරෝපයේ යුදෙව් ජනයාට එරෙහිව නාසිවාදීන් ගෙන ගිය ජන ඝාතක ව්‍යාපාරයෙන් අනතුරුව, සෝවියට් සංගමය ඊස්රායල රාජ්‍යය ගොඩනැගීමට සහාය දීමෙහි ලා එක්සත් ජනපදය සමග අත්වැල් බැඳ ගති. එහි ප්‍රතිඵලයක් ලෙස, පලස්තීනය රාජ්‍යයන් දෙකක් -- පලස්තීන හා යුදෙව් -- බවට බෙදීම සඳහා ඡන්දය දෙනු පිනිස එක්සත් ජාතීන්ගේ මහා මන්ඩලය පොලඹවාලීමට සියොන්වාදියෝ සමත් වූහ. බ්‍රිතාන්‍යයන් ප්‍රදේශයෙන් ඉවත් වූ අතර 1948 දී ඊස්රායල රාජ්‍යය ප්‍රකාශයට පත් කරන ලදි.

පලස්තීන ජනයා සහාය පතා විවිධ අරාබි තන්ත්‍රයන් දෙසට හැරුනි. එහෙත් අරාබි සංගමයේ හමුදා, භේදව, කිසිත් කරකියා ගත නො හැකි හා ඊස්රායල හමුදා විසින් සංඛ්‍යාත්මකව අභිබවන තත්වයක පැවතුනා පමනක් නොව, එකිනෙකා හා තරඟ වදින අරාබි ධනේශ්වර කල්ලිවල පන්ති අවශ්‍යතාවන්ට -- එනම්, භූමි ප්‍රදේශ සඳහා ඔවුන්ට පවත්නා ආශාවන්ට, "ඔවුන්ගේ ම" කම්කරුවන් හා ගොවීන් සූරාකෑමට ලැබෙන අවස්ථාවන්ට සහ ඒ හෝ මේ ප්‍රධාන බලවතා සමග ක්‍රියාකාරී සබඳතාවක් තහවුරු කර ගැනීමට -- ආයාචනා කිරීම මත වාරු වීමට අධිරාජ්‍යවාදී බලවතුන්ට හැකි විය.

සමහර පලස්තීනුවන් ඊස්රායලය හා අරාබි තන්ත්‍රයන් අතර යුද්ධය මග හරිනු පිනිස සිය නිවාස අතහැර පලා ගිය අතර, බොහෝ දෙනෙක් ඊස්රායල හමුදා ගෙන ගිය මෘග ජනවාර්ගික ශුද්ධ කිරීමේ වැඩපිලිවෙලක් මගින් පිටුවහල් කෙරුනි. ඩෙයර් යසින්හි ජන ඝාතනය මෙම ත්‍රස්ත ව්‍යාපාරය පිලිබඳ මනා නිදසුනක් වූ අතර අරෆත් එම ත්‍රස්ත ව්‍යාපාරයේ බලපෑම විස්තර කලේ ය. ඔහු සියොන්වාදීන් පිලිබඳව මෙසේ පැවසී යː "ඔවුහු අරාබි ජාතිකයන් දශ ලක්ෂයක් පලවා හරිමින් පලස්තීනයේ මුලු ප්‍රදේශයෙන් සියයට 81ක් වාඩිලාගති. එනයින් ඔවුහු අරාබි නගර හා ගම් 524ක් වාඩිලාගත් අතර එයින් 385ක් විනාශ කලේ එම ක්‍රියාදාමයේ දී ඒවායේ සලකුනකුදු ඉතිරි නො කරමිනි. එසේ කිරීමෙන් පසුව, ඔවුහු අපගේ ගොවි බිම්වල හා අපගේ වන බිම්වල නටබුන් මත ඔවුන්ගේ ජනාවාස හා ජනපද තැනූහ."

ඊශ්‍රායලය බවට පත් වූ පලස්තීනයේ කොටස්වල රැඳී සිටියේ 1,200,000ක් වන පලස්තීනුවන්ගෙන් 200,000ක් පමනක් වූ අතර ඔවුහු දෙවන ගනයේ පුරවැසියන් ලෙස සැලකුනි. සෙසු අය අසල්වැසි රටවල, විශේෂයෙන් ම බටහිර ඉවුර ද ඇතුලත් අලුතෙන් පුලුල් කෙරුනු ජෝර්දානයේ, සරනගත කඳවුරුවල පදිංචි විය. ජනතාවක් ලෙස ඔවුන්ගේ පැවැත්ම ම ප්‍රතික්ෂේප කරන ලද්දේ හුදෙක් ඊශ්‍රායලය -- එරට නායක ගෝල්ඩා මෙයර්ගේ ප්‍රසිද්ධ ප්‍රකාශයකට අනුව, "ඔවුහු නො පවතී" -- විසින් පමනක් නොව, පලස්තීනුවන් තම රටවලට උකහා ගැනීමට හෝ ඔවුන්ගේ භූමිය යලි ලබා ගැනීමට සටන් වැදීමට හෝ කිසිදු අභිප්‍රායක් නොමැති වූ අරාබි නායකයන් ද විසිනි.

අරෆත් අරාබි පාලකයන්ගේ ද්‍රෝහිත්වය පිලිබඳව හොඳින් දැන සිටියේ ය. එහෙත් ආරම්භයේ පටන් ම ඔහුට හැඟුනේ ව්‍යසනකාරී ප්‍රතිවිපාක සහිතව වුවත් ඔවුන් අතර උපාමාරු දැමීමට වඩා විකල්පයක් තමන්ට නොමැති බවයි.

1954 දී ඊජිප්තුවේ බලයට පැමිනි කර්නල් අබ්දුල් නසාර් අරාබි ලෝකය පුරා ජනප්‍රිය මිථ්‍යාවන් අවුලුවාලී ය. ඒ මක් නිසා ද කිය තොත් ඔහු අරාබි සමාජවාදය යන නම යටතේ සීමිත සමාජ හා ආර්ථික ප්‍රතිසංස්කරන වැඩපිලිවෙලක් ක්‍රියාවට දමමින් තම නායකත්වය යටතේ සර්ව-අරාබි එකමුතුවක් ඉල්ලා සිටි බැවිනි.

අරෆත් එකල ඊජිප්තුව මගින් පාලනය වූ ගාසා ප්‍රදේශයට ගොස් ඊශ්‍රායලයට එරෙහිව කඩා පනින ප්‍රහාර එල්ල කල පලස්තීන පැරා මිලිටරි කන්ඩායම් තුල ක්‍රියාකාරී වූ අතර අබු ඉයාඩ් සහ අබු ජිහාඩ් සමග ඒකාබද්ධ විය. නසාර්, මොස්කව් ස්ටැලින්වාදී තන්ත්‍රයේ ආර්ථික හා මිලිටරි සහයෝගය සහිතව, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අතරමැදි ක්‍රියාකාරිත්වයෙන් යුත් ගිවිසුමක් අත්සන් කලේ ය. එයට අනුව එක්සත් ජාතීන්ගේ හදිසි හමුදාවක් (යුඑන්ඊඑෆ්) ගාසා ප්‍රදේශයේ පොලීසියක් ලෙස ක්‍රියා කරමින් ඊශ්‍රායලයට එරෙහිව කඩා පනින ප්‍රහාර එල්ල කිරීමෙන් පලස්තීන ගරිල්ලා භටයන් වලකාලීමට නියමිත විය. පලස්තීන ගරිල්ලන් කොටු කරන ලද අතර අරෆත් හා ඔහුගේ සමීප සගයෝ හුදකලා කෙරුනි.

1957 දී අරෆත් සහ අබු ජිහාඩ් කයිරෝවේ සිට කුවේටයට මාරු වූ අතර එහි දී අබු ඉයාඩ් සමග එක්ව පලස්තීන ජාතික විමුක්ති ව්‍යාපාරය හෙවත් අල් ෆටේ පිහිටුවී ය. මෙම සංවිධානය එක් කාරනාවක් මත පමනක් පාදකව අරගලයක් දියත් කලේ ය. එනම්, ඊශ්‍රායලය විසින් අල්ලා ගනු ලැබූ භූමිය යලි අත්පත් කර ගැනීම සහ ප්‍රජාතන්ත්‍රවාදී සහ නිර්-ආගමික පලස්තීනයක් ගොඩනැගීම යි.

1964 දී ඊශ්‍රායලය ඉහල ජෝර්දාන් නදියේ ජලය හැරවීමට තර්ජනය කල විට අරාබි සංගමයේ අනුග්‍රහයෙන් පලස්තීන විමුක්ති සංවිධානය (පීඑල්ඕ) පිහිටුවීමෙහි ලා ඊජිප්තුව මූලික ක්‍රියාකලාපයක් ඉටු කලේ ය. නසාර් පීඑල්ඕ නායක අහමඩ් ෂුකෙයිරි හරහා එම සංවිධානය මත ආධිපත්‍යය පවත්වා ගෙන යාමට උත්සාහ කල අතර පීඑල්ඕවේ සන්නද්ධ බලකායන් ඊජිප්තුවේ, සිරියාවේ, ජෝර්දානයේ සහ ඉරාකයේ හමුදාවල කොටසක් විය.

ෆටේ පීඑල්ඕවට එක් විය. එහෙත් පලස්තීන සටන්කාමීන්ගේ බල බිඳීමට දැරුනු ප්‍රයත්නයන් පරාජය කිරීම අරෆත්ගේ අභිප්‍රාය වූ අතර ඔහු ඊශ්‍රායලයට එරෙහිව සන්නද්ධ අරගලය දිගටම ඉල්ලා සිටියේ ය. ඊට ප්‍රතිචාර වසයෙන්, අල් ෆටේ සාමාජිකයෝ තව දුරටත් මර්දනයට ලක් කෙරුනි. ජෝර්දානයේ හුසේන් රජු සියලු ෆටේ සටන්කාමීන් දඩයම් කොට අත් අඩංගුවට ගන්නා ලෙස අන කලේ ය.

1967 අරාබි-ඊශ්‍රායල යුද්ධය, අරාබිවරුන්ට හා යුදෙව්වන්ට එක සේ, සන්ධිස්ථානයක් විය. දින හයක කාලයක් තුල දී ඊශ්‍රායලය විසින් අරාබි හමුදා විනාශ කිරීම ඊජිප්තුවේ හා සිරියාවේ නිර්-ආගමික ජාතිකවාදී තන්ත්‍රයන් ද ඔවුන්ගේ සෝවියට් ස්ටැලින්වාදී මුක්කුකරුවන් ද බරපතල ලෙස අපකීර්තියට ලක් කලේ ය. ඊශ්‍රායලය, තවත් සරනගතයන් 350,000ක් නිර්මානය කරමින් ද නැගෙනහිර ජෙරුසලම ඈඳා ගනිමින් ද සිය භූමි ප්‍රදේශ දැවැන්ත පරිමානයෙන් පුලුල් කර ගති.

යුද්ධය නසාර්ගේ සර්ව-අරාබි ව්‍යාපෘතියේ අවසානය සනිටුහන් කලේ ය. ඉන් අනතුරුව, සියලු අරාබි ධනේශ්වර තන්ත්‍ර වේගයෙන් දකුනට ගමන් කලේ ය. සිරියාවේ හා ඉරාකයේ, මිලිටරිය හෝ මිලිටරියේ සහාය ලැබෙන තන්ත්‍ර බලයට පත් වූ අතර ඊජිප්තුව, තෙල් සම්පතින් අනූන, තත්වාරක්ෂක සහ බටහිර-ගැති රාජ්‍යයන්ට නය ගැති රාජ්‍යයක් බවට පත් විය.

## ෆටේ සංවිධානය පීඑල්ඕවේ බලය අල්ලා ගනී

අරාබි පරාජය තුඩු දුන්නේ පලස්තීනුවන්ගේ විමුක්තිය උදෙසා ස්වාධීන මිලිටරි ව්‍යාපාරයක් දියත් කල යුතු යයි ඉල්ලා සිටි විවිධ ගරිල්ලා සංවිධාන වර්ධනය වීමට ය. මෙතැන් පටන් ඉදිරියට ඊශ්‍රායලයට එරෙහි අරගලය ගෙනා යාමට නියමිත වූයේ, ඇල්ජීරියානුවන් හා වියට්නාම්වරු විසින් යොදා ගැනුනු ගරිල්ලා උපක්‍රම භාවිත කරමින්, පලස්තීන ජාතිකවාදයේ ධජය යටතේ ය.

ෆටේ සංවිධානය මෙම ගරිල්ලා සංවිධානවලින් වඩාත් ම වැදගත් කන්ඩායම ලෙස ඉස්මතු විය. ඒ විශේෂයෙන් ම, 1968 මාර්තුවේ බටහිර ඉවුරේ කරාමේහි දී ඊශ්‍රායලයට එරෙහිව එය ගත් ආස්ථානයෙන් පසුව ය. 1969 පෙබරවාරියේ කයිරෝවේ පැවති පලස්තීන සම්මේලනයක දී එය පීඑල්ඕවේ නායකත්වය ඉවත් කිරීමට සමත් වූ අතර අරෆත් පීඑල්ඕවේ නව සභාපති බවට පත් විය.

ෆටේ සංවිධානයේ සාමාජිකත්වය සංඛ්‍යාත්මකව කිහිප සියයක සිට 30,000 දක්වා වැඩුනු අතර එය ඊස්රායලයට එරෙහිව නිරන්තර ප්‍රහාර එල්ල කලේ ය. එහි දේශපාලන හා මිලිටරි සාර්ථකත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස, ෆටේ සංවිධානයේ නායකත්වය යටතේ වූ පීඑල්ඕව පලස්තීන ජනතාවගේ සැබෑ මහජන ව්‍යාපාරයක් බවට පරිවර්තනය විය. 1960 ගනන් අග සිට, පලස්තීන ජනතාවගේ සහ පීඑල්ඕවේ අරගලය, මැද පෙරදිග පුරා විප්ලවවාදී අරගලවල උත්ප්‍රේරක බලය හා නාභිය බවට පත් විය.

## 1970-1982 පාවාදීම

ඉන් පසුව එලඹුනු විසි වසරක කාලය තුල දී, නැවත නැවතත් අරාබි තන්ත්‍රයන් අතින් විවිධ ප්‍රහාරයන් අත් විඳීමට පීඑල්ඕවට සිදු විය: එනම්, ජෝර්දානය විසින් සිදු කෙරුනු 1970 "කලු සැප්තැම්බර්" පලස්තීන ජන ඝාතනය, ඉන් පස් වසරක් අවෑමෙන් කරන්ටිනා හා ටෙල් අල් ෂාටර් කඳවුරුවල දී ලෙබනන් ෆැසිස්ට්වාදීන් පලස්තීනුවන් සමූලඝාතනය කිරීමේ දී සිරියාව දැක්වූ සහයෝගීතාව, 1982 දී සබ්රා හා ෂටිල්ලා කඳවුරුවල සිදු වූ එයාකාර ජන ඝාතන, අල්ලා ගත් භූමි ප්‍රදේශවල ඊශ්‍රායලය ගෙන යන මර්දනයන්ට විරුද්ධ වීම මේ දක්වා ම අරාබි තන්ත්‍රයන් ප්‍රතික්ෂේප කිරීම.

1970න් පසුව ලෙබනනය තුල පදනම් වූ පීඑල්ඕවට එරෙහිව සිරියාවේ මැදිහත්වීම, විශේෂයෙන් ම දූෂ්ට සහගත විය. 1970 ගනන් මැද දී, ලෙබනනයේ කමාල් ජම්බ්ලාට්ගේ නායකත්වයෙන් යුත් වාම ජාතිකවාදී හමුදා සහ ෆැසිස්ට්වාදී ක්‍රිස්තියානි ෆලාන්ජේ අතර හටගත් පුලුල් වන සිවිල් යුද්ධයක් තුලට පීඑල්ඕව ඇද ගැනුනි. අරෆත් ජම්බ්ලාට්ට සහාය දුන් අතර වාමවාදී හමුදා දක්ෂිනාංශිකයන් පලවා හැරීමට ආසන්න මට්ටමකට ලඟා වන විට සිරියාව ඔවුන්ට එරෙහිව මැදිහත් විය. කරාටිනා හා ටෙල් අල් ෂාටර් ජන ඝාතන මෙම පාවාදීමේ ප්‍රතිඵල විය.

1982 දී, ඊස්රායලය, එක්සත් ජනපදයේ සහාය ද ලැබ, පීඑල්ඕව නෙරපා හරිනු පිනිස ලෙබනනය ආක්‍රමනය කල විට, සිරියානු ධනේශ්වර තන්ත්‍රය, පීඑල්ඕව ආරක්ෂා කිරීමට එක ඇඟිල්ලක් වත් එසවීම ප්‍රතික්ෂේප කිරීම මගින්, පලස්තීන ජනතාවගේ අරමුනු වෙනුවෙන් තමන් තුල පවත්නා වෛරය යලිදු වතාවක් ප්‍රදර්ශනය කලේ ය. එහි දී පීඑල්ඕවට ලෙබනනය හැර ගොස් ටියුනිස්හි සිය නව මූලස්ථානය ගොඩනගා ගැනීමට බල කෙරුනි.

1982 සබ්රා හා ෂටිල්ලා ජන ඝාතන නතර කරන ලෙස ඉල්ලා සිටියේ ඊස්රායල කම්කරු පන්තිය යි. ජන ඝාතනය සිදු වීමට ඉඩ හැරි මෙනකන් බෙගින්ගේ ලිකුඩ් ආන්ඩුවට හා ආරක්ෂක ඇමති ඒරියල් ෂැරොන්ට විරුද්ධව, 400,000කට අධික ජනයා, එනම්, මුලු ජනගහනයෙන් දහයෙන් පංගුවක්, ටෙල් අවිව්හි වීදිවලට බටහ. මෙය වනාහි ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රගතිශීලී මනෝගතීන් බලගතු ලෙස ප්‍රකාශයට පත් වීමක් මෙන් ම, අරාබි හා යුදෙව් කම්කරුවන්ගේ ඒකාබද්ධ අරගලයක් ගොඩනැගීමට පවත්නා විභවය එලිමහනට ගෙන ඒමක් ද විය. එවන් අරගලයක් වර්ධනය කල හැකි වන්නේ මැද පෙරදිග පුරා කම්කරුවන්ගේ හා පීඩිත ජනතාවගේ පන්ති අවශ්‍යතාවන්ට ආමන්ත්‍රනය කරන සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත ම පමනි.

1973 "යොම් කිපුර්" යුද්ධයට පසුව, ඊජිප්තු නායක අන්වර් සදාත් එක්සත් ජනපදය හා ඊස්රායලය දෙසට ඍජු සුහදශීලී නැඹුරුවක් ගැනීම ආරම්භ කලේ ය. එම නැඹුරුව කුලුගැන්වුනේ 1978 කැම්ප් ඩේවිඩ්හි දී ඔහු ඊස්රායලය පිලිගැනීමෙනි. ඊස්රායලය සිය අසල්වැසියන්ට එරෙහි ඕනෑම අනාගත යුද්ධයක දී ඉතා ම වැදගත් අරාබි රටෙහි මැදහත් භාවය සහතික කර ගත් අතර එමගින් පීඑල්ඕව හුදකලා කොට පලස්තීනුවන්ට එරෙහිව සිය අත් ශක්තිමක් කර ගැනීමට ද එය සමත් විය.

## ඉන්ටිෆාඩා සහ සෝවියට් සංගමයේ බිඳ වැටීම

1980 ගනන් මැද වන විට, අරෆත් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ග්‍රහනය තුලට තල්ලු කිරීමට තුඩු දුන් ප්‍රධාන දේශපාලන වෙනස්කම් ගනනාවක් සිදු වෙමින් පැවතුනි. වඩාත් ම මූලික වෙනස වූයේ මිඛායෙල් ගොර්බචෙව් යටතේ වූ ස්ටැලින්වාදී නිලධරය, ධනවාදී පුනස්ථාපනය හා ලෝක අධිරාජ්‍යවාදයේ ව්‍යුහයන් තුලට සෝවියට් සංගමය යලි ඒකාග්‍ර කිරීම දෙසට ගත් හැරීම යි. 1987 දී, "සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය, ඊස්රායලය සමග ගැටුම සම්බන්ධයෙන් ඇති කෙරෙන දේශපාලන විසඳුමක් සඳහා තමන් සහාය දෙන බව සංඥා කොට, තම සම්ප්‍රදායික සේවාදායකයින්ට කෙරෙන ආයුධ සැපයුම අඩු කර ඊජිප්තුව, ජෝර්දානය හා ඊස්රායලය සමග රාජ්‍යතන්ත්‍රික හා ආර්ථික සබඳතා පුලුල් කර ගති." (මාර් සහ ලුවිස්, *Riding the Tiger* (ව්‍යාඝ්‍රයාගේ පිටෙහි යාම), වෙස්ට්වීව් ප්‍රෙස්, 1993, 92 පි.)

ඒ සමග ම, 1987 දෙසැම්බරයේ දී, අල්ලා ගත් භූමි ප්‍රදේශවල පලස්තීන කම්කරුවන්ගේ හා තරුනයන්ගේ ස්වයං-සිද්ධික නැගිටීමක් වූ ඉන්ටිෆාඩා ව්‍යාපාරය පිපුරුනි. මෙය ඊස්රායලය පමනක් නොව, විප්ලවවාදී ව්‍යාපාරය පාලනය කර ගත නො හැකි මට්ටමකට උත්සන්න වී මැද පෙරදිග පුරා රැඩිකලීකරන බලපෑමක් ඇති කරනු ඇතැයි භීතියට පත් වූ අරාබි ධනේශ්වරය හා එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ද කම්පනයට ලක් කලේ ය.

තමන් වාරු වී සිටි අරාබි තන්ත්‍රයන් සියල්ල ම වොෂිංටනය සමග හොඳ හිත ඇති කර ගැනීමට උත්සුක වූ ද එක්සත් ජනපදය මැද පෙරදිග සිය ආධිපත්‍යයට එරෙහිව බැරෑරුම් අභියෝගයකට මුහුන නොදුන්නා වූ ද තතු යටතේ, අරෆත්ට උපාමාරු දැමීම සඳහා පැවති ඉඩකඩ දවැන්ත පරිමානයෙන් බාධනය වී තිබුනි. 1988 දෙසැම්බරයේ දී, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් වචනයෙන් වචනය නියම

කෙරුනු නිවේදනයක් නිකුත් කරමින්, අරෆාත් ඊස්රායලයේ ආරක්ෂාව සම්බන්ධයෙන් සහතිකයක් දී, ඊස්රායලය සමග සාම සම්මුතියක් "අන්තර් වාර උපායක් නොව මූලෝපායක්" ලෙස පිලිගෙන," පුද්ගල, කාන්ඩමික සහ රාජ්‍ය ත්‍රස්තවාදය ඇතුලු" ත්‍රස්තවාදයේ සියලු ම රූපාකාරයන් ප්‍රතික්ෂේප කලේ ය. තමන් ඊස්රායලය පිලිගැනීම ප්‍රකාශයට පත් කරන ලෙස ප්‍රවෘත්ති සාකච්ඡාවක දී ඔහුගෙන් ඉල්ලා සිටි විට, සිය නින්දිත යටත් වීම අවංකව පිලිගනිමින් අරෆාත් මෙසේ පැවසී යඃ "ඔබට අවශ්‍ය මොනවා ද? ඔබට අවශ්‍ය මා මාගේ ඇඳුම් උනා දමා නිරුවත් රංගනයක යෙදීම ද? එය නොහොබිනා ක්‍රියාවක් විය හැකි ය."

අරෆාත්, එක්සත් ජනපදයට හා ඊස්රායලයට විරුද්ධ වීමෙහි ලා වාරු විය හැකි යම් පදනමක් සහතික කර ගැනීමේ අවසන් ප්‍රයත්නයක් වසයෙන්, 1991 දී සදාම් හුසේන්ගේ බාත්වාදී තන්ත්‍රය වොෂිංටනයේ ප්‍රහාරයට ලක් වූ විට එම තන්ත්‍රයට සිය සහයෝගය ප්‍රකාශ කලේ ය. එහෙත් අරාබි තන්ත්‍රයන් එක්සත් ජනපද යුද මෙහෙයුම ඉදිරියේ දනින් වැටුනු බැවින්, තමන් මුලුමනින් ම හුදකලාව ඇති බව අරෆාත්ට දැනුනි. ප්‍රථම ගල්ෆ් යුද්ධය අවසන් වූ වහා ම යලිත් සාකච්ඡා සඳහා තල්ලු වීමට අරෆාත්ට බල කෙරුනි. එම සාකච්ඡා කුලුගැන්වූනේ 1993 ඔස්ලෝ ගිවිසුමෙනි.

පලස්තීන ජාතික අධිකාරිය (පීඒ) නිර්මානය කරමින් ඔස්ලෝහි දී අරෆාත් පිලිගත් කොන්දේසි ප්‍රජාතන්ත්‍රවාදී, නිර්-ආගමික පලස්තීනයක් පිලිබඳ ෆටේ සංවිධානයේ ප්‍රකාශිත අරමුනුවලින් බෙහෙවින් දුරස්ථ විය. පීඑල්ඕ-ඊස්රායල ගිවිසුම නියෝජනය කලේ, පලස්තීන භූමියෙන් සියයට 22ක් හැර අන් සියලු ප්‍රදේශ සම්බන්ධයෙන් පලස්තීන ජනතාවට පවත්නා හිමිකම අතහැර දැමීමකි. එය අල්ලා ගත් භූමි ප්‍රදේශවල ආරක්ෂාව පිලිබඳ වගකීම භාර ගන්නා පීඑල්ඕ නායකත්වයෙන් යුත් අන්තර් වාර අධිකාරියක් පිහිටුවිය හැකි යයි යෝජනා කලේ ය. එමගින් ඊස්රායලය මිලිටරි වාඩිලෑමේ බරින් නිදහස් කොට දේශ සීමා, විදේශ පිලිවෙත සහ බටහිර ඉවුරේ හා ගාසා තීරයේ පවතින නීති විරෝධී ජනපදවල ආරක්ෂාව යනාදියේ පාලනය සියොන්වාදී තන්ත්‍රය අත ම තැබීමට නියමිත විය.

ඊස්රායල වාඩිලෑමට හා මර්දනයට එරෙහි පලස්තීන මහජනතාවගේ විරුද්ධත්වය මැඩලීමේ ක්‍රියා කලාපය තථ්‍ය ලෙස ම අරෆාත්ට භාර වුනි.

ඔස්ලෝවේ මූලිකත්වයෙන් දියත් කෙරුනු ඊනියා "සාම ක්‍රියාදාමය" ප්‍රෝඩාවක් විය. පසුගිය දශකය අයත් වන්නේ, දිගු කාලයක් තිස්සේ විවිධාකාර ගැහැට විඳිමින් සිටින පලස්තීන ජනතාව අත් විඳි කටුකම අත්දැකීම් අතරට ය. අද ඔවුන්ගේ සමාජ හා ආර්ථික තත්වය පලස්තීන අධිකාරිය නිර්මානය කිරීමට පෙරාතුව පැවති කොන්දේසිවලට වඩා නරක ය. ඔවුන් අත්දැක ඇත්තේ, නිරන්තර ම්ලේච්ඡ ප්‍රහාර හා නැවත නැවතත් සිදු කෙරුනු මිලිටරි කඩාපැනීම් මෙන් ම සිය නායකයන් ඝාතනය කිරීම සහ පලස්තීන අධිකාරියේ මුදුනත දූෂිත ධනේශ්වර තට්ටුවක් තහවුරු වීම යි. දැන් එම ධනේශ්වර තට්ටුව සූදානම් වන්නේ, අවසානයේ එක්සත් ජනපදය හා ඊස්රායලය විසින් සූදානම් කෙරෙන මොන යම් හෝ ද්‍රෝහී සම්මුතියකට අත්සන් කිරීමට ය.

ඊස්රායලය, සිය නීති විරෝධී ජනපදකරන ක්‍රියාවන් නතර කරන බවට ඔස්ලෝ ගිවිසුම යටතේ දුන් පොරොන්දුව කඩ කල අතර 1993 සිට අනුප්‍රාප්තික ඊස්රායල ආන්ඩු යටතේ එසේ පදිංචි කෙරුනු සංඛ්‍යාව දෙගුනයකටත් වඩා ඉහල නැග තිබේ. නැගෙනහිර ජෙරුසෙලමේ තත්වය සහ පලස්තීන සරනගතයන්ට හා ඔවුන්ගෙන් පැවත එන්නන්ට ආපසු සිය භූමි ප්‍රදේශවලට පැමිනීමට ඇති අයිතිය යන ප්‍රධාන ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීම ද සියොන්වාදීන් දිගට ම ප්‍රතික්ෂේප කොට ඇත.

දෙන ලද සීමිත සහන පවා ඊස්රායල දක්ෂිනාංශික හා ජනපදවාසී පක්ෂ වෙතින් කෝපාවිෂ්ඨ විරුද්ධත්වයක් අවුලුවා ලී ය. එය ඇරඹුනේ, අරෆාත් සමග සාකච්ඡාවන්ට සහභාගි වූ ලේබර් පක්ෂ අගමැති යිට්ශාක් රෙබින් 1995 නොවැම්බරයේ දී ඝාතනය කිරීමෙනි. එම ඝාතනයට පෙරාතුව, ජනපදකරනයට පක්ෂ ලිකුඩ් පක්ෂයේ නායක බෙන්ජමින් නෙතන්යාහු රෙබින්ට එරෙහිව උමතු සහගත උද්ඝෝෂනයක් ගෙන ගිය අතර ඝාතනය පෙලඹ වූ බවට රෙබින්ගේ වැන්දඹුව නෙතන්යාහුට ඍජුව ම චෝදනා කිරීමට ද එය තුඩු දුනි. පලස්තීනුවන් සමග මොන යම් හෝ සම්මුතියක් ඇති කර ගැනීමෙන් ඉවතට ඊස්රායල පාලක ප්‍රභූව ගත් හැරීමක් රෙබින් ඝාතනය මගින් සලකුනු විය.

නෙතන්යාහුගේ නායකත්වයෙන් ලිකුඩ් පක්ෂය මැතිවරනයෙන් බලයට පත් වීම, පලස්තීනුවන් සමග පැවති සියලු සාකච්ඡා හිතාමතා ම කඩාකප්පල් කිරීමේත් අරෆාත්ගෙන් වඩ වඩා දුෂ්කර සහන ඉල්ලීමේත් පිලිවෙතකට මුල පිරී ය. අවි බිම තැබීම, නැගෙනහිර ජෙරුසෙලමට ආපසු පැමිනීමේ අයිතියත් ඒ සඳහා අයිතිවාසිකම් කීමත් අතහැර දැමීම යන මෙම සහන පිදීමට අරෆාත් අකමැති වූ අතර ම පලස්තීනුවන් අතර වැඩෙන මහජන විරෝධය හමුවේ ඒවා ඉටු කිරීම ද ඔහුට කල නොහැකි කාර්යයක් විය.

වසර 2000 ජුලි මස මේරිලන්ඩ්හි කෑම්ප් ඩේවිඩ්හි දී එක්සත් ජනපද ජනාධිපති ක්ලින්ටන්ගේ මූලිකත්වයෙන් පීඑල්ඕව හා ඊස්රායල ලේබර් අගමැති එහුඩ් බරාක් අතර සාකච්ඡා මගින් පෙන්නුම් කෙරුනේ, ජාත්‍යන්තර අරමුදලකින් වන්දි ලබා දීමට හිලව් වසයෙන්, අතිශයින් ම ජනාකීර්න යුදෙව් ජනාවාස ඈදා ගැනීමට ඊස්රායලයට ඉඩ දීම සහ පලස්තීන භූමි ප්‍රදේශවලට යලි පැමිනීමේ අයිතිය සීමා කිරීම පවා ඇතුලු, ඔස්ලෝ ගිවිසුම යටතේ දුන් සහන ඉක්මවා යන සහන දීමට අරෆාත් සූදානම් බවයි.

එහෙත් සමස්ත ජෙරුසෙලම ම ඊශ්‍රායල ස්වෛරීත්වය යටතේ දිගට ම පැවතිය යුතු ය යන යෝජනාව පිලිගැනීම අරෆත්ට කල නොහැකි විය. සාකච්ඡා බිඳ වැටුනු අතර ඊශ්‍රායලයට එරෙහිව ඉන්ටිෆාඩා ව්‍යාපාරය යලි ඇරඹිය යුතු යැයි ඉල්ලමින් සිය ගනනක් ගාසා තීරයේ පෙලපාලි දැක්වූ හ. ජෙරුසෙලම පිලිබඳ ඊශ්‍රායල ඉල්ලීම්වලට යටත් වීම අරෆත් ප්‍රතික්ෂේප කිරීම හේතු කොට ගෙන, ඇලෙක්සැන්ඩ්‍රියාවේ, ඊජිප්තුවේ හා පලස්තීන අධිකාරිය තුල ජනයා ප්‍රීති ඝෝෂා නගා ඔහුව වීරයකු සේ පිලිගති.

2000 සරත් සමයේ දෙවන ඉන්ටිෆාඩාව පැනනැගීම සිදු වූයේ, ඊශ්‍රායලයෙන් සහන ඉල්ලා කෙරුනු ජාත්‍යන්තර බලපෑම් අවසන් කර ගැනීමේ විධි ක්‍රමයක් ලෙස ලිකුඩ් පක්ෂය හා ඒරියල් ෂැරොන් විසින් හිතාමතාම සිදු කරන ලද ප්‍රකෝපකරනයන් හේතු කොට ගෙන ය. අරෆත් ඔවුන් ඉල්ලා සිටි මට්ටමේ රුදුරු භාවයකින් යුතුව පලස්තීනුවන් මැඩීම ප්‍රතික්ෂේප කිරීම නිසා, ඊශ්‍රායලය හා එක්සත් ජනපදයේ බුෂ් ආන්ඩුව විසින් ඔහු රාක්ෂයකු ලෙස හෙලා දකින ලදි. මෙය ඔහුගේ ගෞරවයට හේතු වේ. එහෙත් ඔහුගේ උරුමක්කාරයන්ට එලෙස මනස්තාපයට හේතු වන කාරනා නොපවතිනු ඇත. මෙහි දී ද, සියලු තන්හි දී මෙන් ම, තීරනාත්මක වන්නේ එක් එක් නායකයාගේ ආත්මීය අභිප්‍රායන් හා ගතිගුන නොව, ඔවුන් නියෝජනය කරන සමාජ බලවේග යි.

අරෆත් සිය දිවියේ අවසාන කාලයේ දී ඊශ්‍රායල හා ඇමරිකානු පාලක ප්‍රභූන්ගේ අසීමිත වෛරයට ලක් වීම, ඔහුගේ දේශපාලන සීමාසහිතකම් තිබිය දී ම, ඔහුගේ ඓතිහාසික කාර්ය භාරයටත් සිය ජනතාව කෙරෙහි ඔහුට පැවති කැපවීමටත් පිදුනු උපහාරයකි. අරෆත් මෙන් එවන් හිරිහැරයක් දරා ගෙන සිටි වෙනත් ප්‍රමුඛ දේශපාලන නායකයෙක් පසුගිය අඩ සියවසේ බොහෝ විට සිටියේ නැත. සිය සමීපතම දේශපාලන සගයන් හා සහෝදරයන් ඝාතනයට ලක් වීම අත්විඳි ඔහු ම කිහිප වතාවක් ම ඝාතන ප්‍රයත්නයන්ට ඉලක්ක විය.

ඊශ්‍රායලය හා එක්සත් ජනපදය ඔහුට සැලකූ අයුරු ම්ලේච්ඡ ය. මහලු වියේ අසනීපයෙන් සිටි ඔහුට, ඊශ්‍රායල හමුදාවන් මගින් වටකරන ලදුව, අති මූලික පහසුකම්වලින් පවා තොරව, රාමල්ලාහි පලස්තීන අධිකාරියේ මූලස්ථානයේ කාමර කිහිපයකට කොටු වී නිවාස අඩස්සියේ අවසානය තෙක් ම පාහේ මාස ගනනාවක් සිටීමට බල කෙරුනි. එහෙත් ඊශ්‍රායල්වරු තමාට ආපසු ඒමට කිසිදාක ඉඩ නොදෙනු ඇත යන භීතිය හේතු කොට ගෙන, ඔහු එම ස්ථානය හැරදා යාම ස්ථිරසාරව ප්‍රතික්ෂේප කලේ ය.

අවසානයේ පවා, වෛද්‍ය ප්‍රතිකාර පිනිස පැරීසියට යාම සඳහා රාමල්ලා නගරයෙන් පිටවීමට ඔහු එකඟ වූයේ, ඔහුට ආපසු ඒමට ඉඩ දෙන බවට ඊශ්‍රායල ආන්ඩුව සහතික වීමෙන් පසුව පමනි. සිය ජනතාවගේ අරගලයට ඔහුගේ කැපවීම එබඳු ය.

අරෆත් ප්‍රතිවිරෝධී හා පරස්පර උරුමයක් ශේෂ කොට ගොස් ඇත. එහෙත් අධිරාජ්‍යවාදී පීඩනයෙන් හා අසමානතාවයෙන් විරේක කෙරුනු ලෝකයක් තුල, අනාගත පරම්පරාවෝ, පලස්තීන ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් ඔහුගේ කැපවීම අගය කරනු ඇත, එයට ගෞරව කරනු ඇත. අරගලයේ යෙදෙන මනුෂ්‍ය වර්ගයා කිසිදාක අමතක නොකරනු ඇති දුලබ දේශපාලන නායකයන්ගෙන් අයෙකි ඔහු.

© www.wsws.org